2021-08-06 {Friday}

WC - 734

sil-08-08-uns-049928-54x4-wss

# ලංසු සඳහා ආරාධනයයි

## විශ්වවිද්‍යාලයීය රෝහල සඳහා, 1.3 MW වහලය මත සවිකළ ජාලකයට සම්බන්ධිත සූර්ය බලශක්ති පද්ධතියක් සැලසුම් කොට, සපයා, ස්ථාපිත කොට, ක්‍රියාත්මක කොට, නඩත්තු කිරීම

### කොන්ත්‍රාත් අංක : MOD/KDU/06/2020

01. ශ්‍රී ලංකාවේ, රත්මලානේ, ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උප කුලපති වෙනුවෙන්, ආරක්ෂක අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, ඉහතින් සඳහන් කාර්ය ඉටුකිරීම සඳහා, සුදුසුකම්ලත් ලංසුකරුවන් (ශ්‍රී ලාංකිකයන් පමණයි) වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය වැඩ පවත්වනු ලැබේ.

02. ආපසු ගෙවනු නොලබන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් 50,000 (ශ්‍රී ලංකා රුපියල් පනස් දහසක්) ගෙවීමෙන් හා ශ්‍රී ලංකාවේ, කෝට්ටේ, ශ්‍රී ජයවර්ධනපුර, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ, ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී I වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, 2021.08.09 දින සිට 2021.08.31 දින දක්වා 1430 පැය සිට, රාජකාරී දිනවල, උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදීගත හැක. ගෙවීම්, මුදලින්ම කළ යුතුවේ. තම ලංසු සමග, (අදාළ වෙතොත්), 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ වන ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කරන ලෙසට අවධාරණයෙන් උපදෙස් දෙනු ලැබේ.

03. සුදුසුකම්ලත් ලංසුකරු, පහත සඳහන් සුදුසුකම් නිර්ණායක සපුරාලිය යුතුය :

අ. තෝරාගත් කොන්ත්‍රාත්කරු සතුව ඉක්ටැඩ් (සීඩා) ලියාපදිංචිය පහත සඳහන් පරිදි තිබිය යුතුය:

| විශේෂඥතාවය | ශ්‍රේණිය |
|---|---|
| විදුලිමය, ගිනි ආරක්ෂණ හා අනාවරණ පද්ධති | EM 4 හෝ ඉහළ |

ආ. පසුගිය වසර 05 තුළ ඉටුකළ කාර්යයන්හි වාර්ෂික ධාරිතාවයේ සාමාන්‍යය අවම වශයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 500 ක් (ශ්‍රී. ලං. රු. මිලියන පන්සියයක්) විය යුතුය.

ඇ. තිබිය යුතු ද්‍රවශීල වත්කම් සහ / හෝ ණය පහසුකම් ප්‍රමාණය, අනෙකුත් කොන්ත්‍රාත්තුමය බැඳීම් හා මෙම කොන්ත්‍රාත්තුව යටතේ කෙරෙනු ලබන යම් අත්තිකාරම් ගෙවීම් හැර, ශ්‍රී ලංකා රුපියල් මිලියන 70 (ශ්‍රී. ලං. රුපියල් මිලියන හැත්තෑවක්) කට නොඅඩු විය යුතුය.

ඈ. පසුගිය වසර 05 තුළ, ලංසුකරු සතුව, 1.3 MW හෝ සමාන සංකීර්ණතාවයෙන් යුත් වහලය මත සවිකළ, ජාලකයට සම්බන්ධිත සූර්ය බලශක්ති පද්ධති, ගිනි ආරක්ෂණ හා අනාවරණ පද්ධති සහිතව සැලසුම් කොට, සපයා, ස්ථාපිත කොට, ක්‍රියාත්මක කොට, නඩත්තු කිරීම සම්බන්ධව එක් එක් විශේෂඥතාවයේ අවම වශයෙන් එක් ව්‍යාපෘතියක් සම්පූර්ණ කළ පළපුරුද්ද තිබිය යුතුය.

ඉ. සාර්ථක ලංසුකරු, අපලේඛනගතවූ අයෙකු නොවිය යුතුය.

04. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, ශ්‍රී ලංකාවේ, කෝට්ටේ, ශ්‍රී ජයවර්ධනපුර, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ, ආරක්ෂක අමාත්‍යාංශයේ, ප්‍රධාන මූල්‍ය නිලධාරී I වෙතින් ලබාගත හැක.

(දුරකථනය : 011-2439381 ෆැක්ස් : 011-2390720, ඊමේල් : procurement@defence.lk)

05. අදාළ ලංසු ලේඛන, ශ්‍රී ලංකාවේ කෝට්ටේ, ශ්‍රී ජයවර්ධනපුර, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ, ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී I වෙතින්, රාජකාරී දිනවල, 0900 පැය හා 1500 පැය අතර කාලය තුළ. නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැක.

(දුරකථනය : 011-2390719, ෆැක්ස් : 011-2390720, ඊමේල් : procurement@defence.lk)

06. මේ සම්බන්ධ පෙර - ලංසු හමුවක්, රත්මලාන, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ රෝහලේදී, 2021.08.17 දින පෙරවරු 11.00 ට පැවැත්වීමට නියමිතය. අදාළ වැඩබිම් චාරිකාව, එදිනම පෙර - ලංසු හමුව ලෙසම පැවැත්වේ. අදාළ පෙර-ලංසු හමුවට සහභාගී වීමට අපේක්ෂා කරනු ලබන ලංසුකරුවන් විසින් එසේ සහභාගි වන අයවලුන්ගේ විස්තර (එනම්, නාමය, ජාතික හැඳුනුම්පත අංකය, සමාගම, තනතුර), අධ්‍යක්ෂ සේවා සැපයුම්, ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, තැ.පෙ. 32, රත්මලාන, ශ්‍රී ලංකාව යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

දුරකථනය : 2632430, ෆැක්ස් : ......................

07. ලංසු, 2021.09.01 දින සිට 2022.01.01 දින දක්වා (ලංසු භාරගැනීමේ අවසන් දින සිට දින 120 ක්) වලංගු විය යුතුය.

08. සියලුම ලංසු සමග, ශ්‍රී ලංකා රුපියල් විසිපන් ලක්ෂයක් (ශ්‍රී ලං. රුපියල් 2,500,000.00) වටිනා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවකින් ලබාගත්, ඒක්ෂණ හා කොන්දේසි විරහිත බැඳුම්කරයක් වශයෙන් වූ, 2021.09.01 දින සිට 2022.02.01 දින දක්වා (ලංසු භාරගැනීම අවසන් කළ දින සිට දින 120 ක්) වලංගු, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් නමට ගත් ලංසු ඇපකරයක් බැගින් තිබිය යුතුය.

09. ලංසු, සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ, ශ්‍රී ලංකාව යන ලිපිනයට යොමු කොට, මුල්පිටපත හා අනුපිටපත ලෙස පහත සඳහන් පරිදි ඉදිරිපත් කළ යුතුය.

| කවරය | අවශ්‍යතා |
|---|---|
| කවරය 01 හා කවර 03 | මුල් පිටපත් 1 හා අනුපිටපත් 1 |
| කවරය 02 | මුල් පිටපත් 1 හා අනුපිටපත් 1 |

10. අදාළ ඉදිකිරීමේ කාලය ලිත් දින 180 කි.

11. ලංසු, පහත සඳහන් ලිපිනයට ගෙනැවිත් භාරදීමෙන් හෝ ශ්‍රී ලංකාවේ, කෝට්ටේ, ශ්‍රී ජයවර්ධනපුර, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ, ආරක්ෂක අමාත්‍යාංශයේ, ප්‍රසම්පාදන ශාඛාවේ තබා ඇති ලංසු පෙට්ටියේ බහාලීමෙන් 2021.09.01 දින 1400 පැයට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

12. 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත ප්‍රකාරව, (අදාළ වෙතොත්), ලංසු ලේඛන මිලදී ගැනීමට පෙර එම ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතු බවට ලංසුකරුවන්හට දැඩිව උපදෙස් දෙනු ලැබේ.

13. ලංසු විවෘත කිරීමේ අවස්ථාවට පැමිණ සිටින ලෙසට ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් හට ඉල්ලීමක් කෙරේ.

14. ලංසුකරුවන් විසින්, අදාළ ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගිවීමට නියමිත පුද්ගලයන්ගේ නම් හා ජාතික හැඳුනුම්පත් / විදේශ ගමන් බලපත්‍ර අංක, ලංසු විවෘත කිරීමේ දිනයට අවම වශයෙන් රාජකාරී දින තුනකට (03) පෙර, ලිඛිතව, ශ්‍රී ලංකාවේ, කෝට්ටේ, ශ්‍රී ජයවර්ධනපුර, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ, ආරක්ෂක අමාත්‍යාංශයේ, ප්‍රධාන මූල්‍ය නිලධාරී I (දුරකථනය : 011-2439381 ෆැක්ස් : 0112390720, ඊමේල් : procurement@defence.lk) වෙත දන්වා සිටිය යුතුය. තවද, ලංසුකරු විසින් මෙම ප්‍රසම්පාදනයට අදාළ ඕනෑම නිල කරුණක් සම්බන්ධව සහභාගි වනු ලබන අයගේ නම හා ජාතික හැඳුනුම්පත් අංකය / විදේශ ගමන් බලපත්‍ර අංකය, අදාළ දිනයට අවම වශයෙන් රාජකාරී දින තුනකට (03) පෙර, ලිඛිතව, ශ්‍රී ලංකාවේ, කෝට්ටේ, ශ්‍රී ජයවර්ධනපුර, ආරක්ෂක මූස්ථාන සංකීර්ණයේ, ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී I වෙත දැනුම් දිය යුතු බවට උපදෙස් දෙනු ලැබේ.

**ලේකම්,**
**ආරක්ෂක අමාත්‍යාංශය,**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,**
**ශ්‍රී ජයවර්ධනපුර,**
**කෝට්ටේ,**
**ශ්‍රී ලංකාව.**